// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2333/10 - 2023 මැයි මස 22 වැනි සඳුදා - 2023.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BD/WM/LND/5/AQUIS/17.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/12/2018/WS/365.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, අලවතුගොඩ (51 ඩී) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අලවතුගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කඩයිම් සිතියම් අංක 710498හි, කලාප අංක 02, පත්‍ර අංක 01 සහ 2023.03.20 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 24න් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0431ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 24**
ඉඩමේ නම: වැලිහෙලපතන; විස්තරය: ජල පිරිපහදු ඒකකය ඉදිකර ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එන්. එම්. ජයතිලක, කිරිදිඇල, බෝගහකුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0431.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ පහත සඳහන් දිනයේ ඒ ඉඩම් කැබැල්ල සඳහා පහත නියම කර ඇති වේලාවට වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

| දිනය | වේලාව | ඉඩම් කැබලි අංක |
|---|---|---|
| 2023.07.05 | පෙ.ව. 10.00 | 24 |

තව ද, 2023.07.05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ඩබ්. එම්. සී. වීරසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2023 මැයි මස 18 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05 - 0203

1A - G 39565 - 16 (2023/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*